

# පස් පියුම්

සුදු නෙළුම්, රත් නෙළුම්, නිල් මානෙල්, හෙල මානෙල්, ඕලු යන මේවා පස් පියුම් වලට අයත් වේ. මේ හැර දිය හබරල, දියබෙරලිය, දිය බරඬැල්, දිය කලාඳුරු, කෙකටිය, කී කිරිඳිය වැනි ජලජ ශාක සමූහයක් එදිනෙදා ජීවිතයේදී අපේ අත්දැකීම් සමග එක්වී පවතී.

නෙළුම් වලට පද්ම, පියුම්, තඹුරු, තාමරස, රත්සර මෙල්මැලි, සියපත්, සරසී, කමල් වැනි නම් ද මහනෙල් වලට උපුල්, උත්පල, ඉඳුවර, ඉන්දීවර වැනි නම්ද යෙදේ. විලක් සම්පූර්ණ වන්නේ එම දියෙහි පියුම් හා හංසයන් ඇති විටය.

බෞද්ධ සංස්කෘතියේදී පද්මය ආධ්‍යාත්මික පාරිශුද්ධභාවය මෙන්ම නිවනද සංකේතවත් කරයි. බොර දියේ, ගොහොරු මඩේ පැලවී වැඩෙන නෙළුම් ගසේ මල පිපෙන්නේ එම අපිරිසිදු දියෙන් ඉහළට මතුවීමෙනි. ආචාර්ය පරණවිතානයන් සංසාර චක්‍රය හැටියට ඇරුත් දෙන සඳකඩ පහනේ මැද ඇති පුබුදු වූ පියුම

## ශාස්ත්‍රයයි සංස්කෘතියයි



විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
**නා.ලි. සාර්ලිස් අමරසිරි**

ආධ්‍යාත්මික පිරිසිදු බව පිළිබිඹු කරයි. බෞද්ධ චිත්‍ර අතර නෙළුම් මල් මෝස්තර වලට සුවිශේෂ තැනක් හිමිවේ. විහාර වල සිවිලිම බොහෝවිට නෙළුම් මල් මෝස්තර වලින් සැරසේ. නුවර යුගයේ බිතු සිතුවම් වල හිස් තැන් පුරවන්නටද නෙළුම් මල් මෝස්තර යොදාගෙන ඇත. සැදැහැතියෝ බුදුන් පිදීමේදී නෙළුම් මහනෙල් වලට වැඩි රුචියක් දක්වති. ගල් කැටයම් අතරද පියුම් අමතක වී නැත. ලීස්තර කැටයම් කිරීමේදී නෙළුම් පෙති රටාව බොහෝවිට උපයෝගී කරගෙන තිබේ. ඇතැම් පා සටහන් සැරසී ඇත්තේත් නෙළුම් මෝස්තරයෙනි. සමනළ සිරිපා සටහන ශ්‍රී පාද පද්මය නමින් හැඳින්වේ. ඇතැම් බුදු පිළිම පද්මාසන මත නෙලා ඇත. චෛත්‍යන්ද පද්මාකාර හැඩයන් ගන්නා අවස්ථා ඇත.

සරස්වතී පද්මාසනයක් මත සිටිනා බැවින් පද්මාසන දේවිය, කුසුමාසන දේවිය වැනි නම් වලින් හැඳින්වේ. සූර්ය දිව්‍යරාජයාගේ අතේ නෙළුමක් වෙයි. විෂ්ණුගේ අතකද නෙළුමක් ඇත. මහබඹු පියුම් නැබ නමිනුත් විෂ්ණු කමල්කල් නමිනුත් ශ්‍රියා කාන්තාව පියුම් කල් පියුම් වැනි නම් වලිනුත් හැඳින්වේ.

කමලං ශීතලං විෂ්ටං- වර්ණ කෘත් කප පිත්ත හෘත්
විස්ඵොට විස විසර්ප- තෘෂ්ණා දාහඝ්‍ර නාසනම්

"සාරාර්ථ සංග්‍රහ"

ආයුර්වේද වෛද්‍ය කර්ම වලදී නෙළුම් මානෙල් ආදියේ ගුණ වර්ණනා වී ඇත. පද්ම සිසිල්ය. මිහිරිය. සෙම් පිත් සමනය කරයි. පවස දැවිල්ල නසයි. විස විසප්පු සුව කරයි. ලේ දොස් නිවයි. නෙළුම් දඬු, නෙළුම් මලේ රේණු, නෙළුම් අල, නෙළුම් කොල ඔසු පිණිස ගැනේ. නෙළුම් අල ගුණදායක ව්‍යංජනයකි. නෙළුම් ඇටද ආහාරයකි. ඕලු හාලේ බත් දියවැඩියා රෝගීන්ට හිතකරය. මානෙල් ඇතුළු බොහෝ ජලජ පැලෑටි වල මෙම සිසිල් ගුණය පවති.

ලහිරු රැසින් බබලන උයද කාලයේදී තඹුරු වන විකසිත වන බවත් ඉරු බැස යද්දී තඹුරු මුකුලිතව උපුල් විකසිත වන බවත් කව් සමයට ඇතුළත්ය. සාහිත්‍යයේදී අපේ කවියන් සංස්කෘත කව් සමය ඔස්සේ යමින් බුදුන් වහන්සේගේත් දෙවියන්ගේ මෙන්ම රජුන්ගේත් කාන්තාවන්ගේත් මුහුණු කමලටත් නෙත් මහනෙලටත් උපමා කිරීමට පෙළඹී ඇත.

"වත නෙත කමලුපුල සරිවි කිවි වදන
බොරුයයි කියති මෙැවම් නොදැක එකතැන
දිය කෙළිනවුන් දැක පොකුණේ පුල් මලින
කිවි බව සැබව නුඹටම පෙනෙනුය එතැන"

"මයුර සන්දේශය"

"තුග තර තරඟ අත් යුත් බමර බැම නිතින්
ඉඳුවර නුවණ යා හසකර තඹර වතින්
සියකර හිමිහු දැක රගනෙ'වි විලඹු මතින්
මමිතුර එසඳ වඩිනේ මැනවි ගුවන'තින්"
"පරෙවි අස්න"

නිල් උපුල් මල් කණ පැලඳ ඇල් ගෙවිලියන් සිටි ගුරුළු කෙත සැළලිහිණි සඳෙස් කරු මෙසේ දකී.

"සලා දුලා පියවුරු තඹර රොන් රත
පුලා නිලා උපුල්වන් ලා ගෙන කණත
කලා පිලා නොව ඇල් ගෙවි කෙළින ඉත
බලා පලා යව අස්වන් ගුරුළු කෙත"

මහ කවි විදු සක්විත්තන් බුත්සරණේ නාලාගිරි දමනයේදී,

"ඈත කෝපයෙන් රත්වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජය, මෑත කරුණායෙන් තේත්වැ ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදු රජාණෝය."

වැනි යෙදුම් භාවිතා කර ඇත.

සීගිරි කැටපත් පවුරේ ගී අතර සංස්කෘත භාෂාවෙන් ලියන ලද මේ ගීයේ උපමාව කෙරෙහිද අවධානය යොමු කරමි.

"පීන පයොධර භාර
ලලිත සාර සරචිත තනු මධ්‍යා
නීලේන්දීවර නයනා
කෙයං සනොරමා රාමා"

නිල් මහනෙල් පෙති වැනි ඇස් ඇති මේ කාන්තාවන් කවරෙක්දැ'යි ඔහු අසයි.

මානල්, නෙළුම්, පද්මලතා, පද්මසිරි, පද්මපාල, පද්මාවතී, පද්මාලංකාර, පද්මකාන්ති, උපුලී, උත්පලා, උත්පලවණ්ණා, උපුල්, පියුමී වැනි නම් වලින් පුද්ගලයන් හැඳින්වීමට සිංහලයෝ පුරුදු වී සිටිති.

ශ්‍රී ලංකාවේ ජතික පුෂ්පය වශයෙන්ද අනුමත වී ඇත්තේ මානෙල් මලය.

පස් පියුමෙන් සැදි විලක ඇති චමත්කාරජනක ස්වභාවය මෙසේ අපේ සංස්කෘතිය හැඩ ගස්වන්නට සහාය වී ඇති අන්දම විස්මිතය. ■

## කස්තිරම

ඩී බී කුරුප්පු

# කපුටන්ට ආප්ප අරන් දීම

අපේ මව් බසට අප ආදරය කරන්නේ උපතින්ම ලැබුණ දායාදයක් නිසා පමණක් නොවේ. බස සමග ජීවිතයේ පියවර හැම එකක්ම ඉදිරියට තබමින් බසෙහි ඇතුළත් රසය, හරය, ප්‍රකාශන ශක්තිය පමණක් නොව බසටම අයත් වයිවාරන්න කියමන්, උපමා, උපහැරණ හා පිරුළු ද අපේ දිවිය සරු කිරීමට සමත් වන නිසා ය.

මේ විෂය ගැන වෙනම ලිපියක් ලිවිය හැකි වුවද මේ ලියන්නේ යට කී ආකාරයේ කීමක් නොහොත් උපහැරණයක් කොතරම් හැ බර වූනක් ද යන්න විග්‍රහ කිරීමට පමණි.

සල්ලි ගොඩ ගසාගෙන වියදම් කරන්නට විදියක් නැති ව ළතැවෙන උදවියට අපි දෙන්නට පුරුදු වූ අවවාදයක් ඇත. "කපුටන්ට ආප්ප අරන් දීපන්"

කපුටෝ අප වාගේ මුදල් ගෙවා කෑම නොකන්නෝ ය. ඔවුන්ට උවමනා කෑම කොහේ හරි කහල ගොඩකින් පහසුවෙන් ලබා ගත හැකි ය. ඉඳ හිට කඩයකින් ආප්පයක් හොරා ගන්නට ලැබුණොත් කපුටා එය මගහරින්නේද නැත. ඒ වුණාට සල්ලි දීලා ආප්ප අරගෙන කපුටන්ට



පූජා කරන්නේ එක්කෝ මෝඩයෝ ය. නැත්නම් ඇත්තටම සල්ලි වලට කරන්නට දෙයක් නැති මහා ධනකුවේරයෝ ය.

ධනකුවේරයකුට හැදෙන්නට ඉඩ ඇති මේ විරල ව්‍යාධිය ආයතනයකට හෝ රජයකට හැදුණොත් කොහොම හිටී ද?

කාක් කාක් කාක් කියාගෙන හොට උල් කරගෙන වටකරගන්නා කාක සේනාව මනස්කාන්ත දර්ශනයක් වනු නිසැක ය.

එහෙම දර්ශනයක් ශ්‍රී ලංකා භූමියේ දී පවා දක්නට නොලැබෙනු ඇත . ඒ නිසා අපි මේ දුලබ දසුන නරඹනු රිසි සකලවිධ ශ්‍රී ලාංකික ජනතාවට ලොව ඇති ඉතා සැප පහසු නගරයක් වන මෙල්බර්න් නුවරට එන්නැයි ආරාධනා කරන්නෙමු.

මෙල්බර්න්හි සාන්ත කිල්ඩා උප නගරයට සම්ප්‍රාප්ත වී අප විසින් කරනු ලබන කාක දාන පුණ්‍ය ක්‍රියාව නරඹනු මැනවි.

ස්ථානය මෑත විවෘත කරන ලද ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයයි. පෙබරවාරි 4 නිදහස් දින උළෙලේදී අපට එහි අධිපති නව නිලධාරියා දැකගන්නට හැකි විය.

අනෙක් සමහරකු නමින්ම දනිතත් මට එක් එක් පුද්ගලයා ගැන කීමට වුවමනාවක් නැත. මගේ විග්‍රහය පුද්ගල රූපකාය හෝ සව්බල පිළිබඳ වූවක් නොවේ. ඔවුන් හොබවන තනතුරු හා ඒ වෙනුවෙන් වැයවන බර පැන පිළිබඳව ය.

දැනට වාර්තාවන අන්දමට සමස්ත කාර්ය මණ්ඩලය මෙන්න මේ වාගේ පිරිසකින් සමන්විත ය.

1 කොන්සල් ජනරාල්
2 නියෝජ්‍ය කොන්සල් ජනරාල්
3 පුද්ගලික සහකාර
4 කොන්සල් නිලධාරි
5 රියැදුරු
6 පළමුවැනි ලේකම්
7 ජ්‍යෙෂ්ට මහජන සම්බන්ධතා නිලධාරි
8 පිළිගැනීමේ නිලධාරි

තවත් සුළු සුළු තනතුරු තිබෙන්නට ඉඩ ඇත. ඒ ගැන අපි කතා නොකර සිටිමු.

මේ බලියට මේ කට මදැයි කියා මේ සුළු පිරිස කෙරෙහි පමණක් අපගේ අවධානය යොමු කරමු.

නිලධාරීන් අතර එක් කාන්තාවක හෝ ඇති බව ආරංචි ය. ඒ අතරම ශ්‍රී ලංකා රජයේ ඇමතිවරයකුගේ පුත්‍ර රත්නයක්ද ලොතරැයි දිනුම්කාරයකු බව කියනු ලැබේ. ශ්‍රී ලාංකික ඕස්ට්‍රේලියානුවරු කෙනෙක් හෝ දෙන්නෙක් සිටිති. ඒ මගේ අනුමානයට ය.

අපට පුරවැසි බව ගැන පශශ්නයක් නැත. එහෙත් මෙරට පුරවැසියන්ට ගෙවල් කුලියට ගැනීම අවශ්‍ය නොවන එක සැලකිය යුතු සාධකයකි. අනෙක් හැම දෙනාටම ගෙවල් අවශ්‍ය ය. අප ඉස්සර නුවර රස්සාවට ගියාම වාගේ කාමරයක් අල්ලාගෙන නවතින්නට බැරි ය. පවුලට සෑහෙන ගෙයක් කුලියට ගත යුතු ය. ගෙයකට ඩොලර් තුන් හාර දහක් බැගින්. ඊළඟට කාර්යාලය පවත්වාගෙන යන වියදම? විදුලිය දුරකතන. දුරකතන නම් අනෙක් නිවාස වලටත් සපයා දිය යුතුයි. නොමිලේ දෙන දුරකතන මේ රටේ නැත .

කවුදෝ කෙනෙක් සම්පූර්ණ වියදම ඩොලර් හැටදාහක්වත් යාවි යයි කීවෝ ය.

ශ්‍රී ලංකාව වනාහි කිරියෙන් පැණියෙන් ඉතිරෙන සමෘද්ධිමත් මහා දේශයකි. අග්‍රගණ්‍ය රාජ්‍යයකි. අප මෙහෙම දුප්පත් රටවලට ඇවිල්ලා දුක් විඳින්නේ ඔය පැත්ත තේරුම් නොගෙන ය. මේ කියන නිලදරු පිරිස එන්නේ අප වාගේ නොදන්නා කමට නොවේ. ටික කලකට විදේශ වාසය සඳහා ය. ඔවුන්ට යහපතක්ම වේවා.

ඒ සමගම අර ප්‍රශ්නය යළිත් මතු කළ යුතු ය.

මේ මහා බල සේනාව මෙල්බර්න් නුවරට කඩා වැදුණේ මේ මහාද්වීපය අල්ලා ගැනීමේ පෙරහුරුවක් වශයෙන් ද? නැතහොත් අනාගත ආක්‍රමණයක් සඳහා මං පාදනු පිණිස ද?

මේ ප්‍රශ්නයට සැලකිය යුතු පිළිතුරක් දිය නොහැකි නම් අප කලින් කී කපුටු කතාව තහවුරු වෙනවා ය. රජයට සල්ලි වැඩිකමට දෙන බලු කපුටු දානයක් අප ඉදිරියේ පවත්වනු ලබන බව ය.

ඕස්ට්‍රේලියාව බඳු ප්‍රජාතාන්ත්‍රික දේශයක මේ වාගේ මනස්ගාතයක් සිද්දවුණා නම් පාර්ලිමේන්තුව තුළ අගමැතිනියට වසරක් පුරාම ප්‍රශ්නවලට උත්තර දීලා නිවනක් නොලැබෙනු නිසැක ය. ශ්‍රී ලංකාව ඒ වාගේ කරදර කරන අය සිටින රටක් නොවේ. බැස යන දියෙන් දෝතක් ගන්නට කට ඇරගෙන සිටින මිනිස්සු මොන එහෙකට කලබල කරද්ද? ■